# ශ්‍රී ලංකාවේ ගැටුම් සමථනය සම්බන්ධයෙන් සමථ මණ්ඩල ක්‍රමයේ වැදගත්කම පිළිබඳ විමසුමක්

ජී.බී.ඒ.එල්.ගුණසේන[4]


## සංක්ෂේපය

ගැටුම යන සංකල්පය මුළු මිනිස් වර්ගයාම කෙරෙහි බලපානු ලැබුවකි. ඈත අතීතයේ පටන්ම ලංකාවේ මෙන්ම ලෝකයේ ද ගැටුම පැවතුණි. මානව වර්ගයා උපත ලද මොහොතේ පටන්ම මූලික අවශ්‍යතා ඉටු කර ගැනීමට යාම තුළ ගැටුම සමාජය තුළ ඇති වූ අතර එය නූතනය වන විට ලෝක සන්දර්භය තුළ නොනවතින සමාජ සංසිද්ධියක් වී ඇත. මෙසේ නිර්මාණය වන ගැටුම නිරාකරණය කරලීම උදෙසා විවිධ ආයතනය සංවිධානය විය. එසේ ඇති වූ ආයතන අතර අධිකරණ පද්ධතියෙන් බැහැරව ඇති වූ ප්‍රාදේශීය ආයතනයක් ලෙසින් සමථ මණ්ඩලය හැඳින්විය හැකිය. මේ හරහා ප්‍රාදේශීය ජනතාවට සිය ගැටුම් නිරාකරණ කටයුතු කාර්යක්ෂම කර ගත හැකිය. මෙලෙසින් ප්‍රාදේශීය සමථ මණ්ඩල ක්‍රමයේ ක්‍රියාකාරීත්වය විමසීම මෙම ලිපියේ අරමුණයි. මෙම ලිපිය සැකසීම සඳහා ද්විතික දත්ත ලෙස පොත්පත්, සඟරා, ලිපි,වාර්තා ආදිය යොදා ගනු ලැබීය. ආරම්භයේ සිට වර්තමානය දක්වා මෙහි විකාශනය මෙන්ම සමථ මණ්ඩල ක්‍රමය ක්‍රියාත්මක වීම තුළ ඒ තුළින් ජනතාවට ලැබෙන ප්‍රතිලාභ මෙන් ම, ආරවුල්කරුවන් මෙන්ම සමථකරුවන් මුහුණපාන ගැටලු එනම් නොදැනුවත්භාවය, කිසිඳු ආයතනයක් හෝ සංවිධානයක සහයෝගයක් නොලැබීම තුළ මෙම සමථ මණ්ඩල ක්‍රමය ක්‍රියාත්මකභාවය පිළිබඳ ගැටලුකාරී තත්ත්වයකට මුහුණ දී ඇති බව මෙහි නිගමනය ලෙස දැක්විය හැකිය.


**මුඛ්‍ය පද;** *ගැටුම්, සමථකරණය, මානව වර්ගයා, සමාජය*

## හැඳින්වීම

### ශ්‍රී ලංකාවේ සමථකරණ ක්‍රියාවලියේ ආරම්භය හා වත්මන සමථ මණ්ඩල ක්‍රමය දක්වා විකාශනය

සමථකරණ ක්‍රියාවලිය මෑත කාලයේ බිහි වූ සංකල්පයක් නොව දීර්ඝකාලීන විකාශයකට උරුමකම් කියනු ලැබුවකි. එයට ද, මිනිසාටම තරම්ම ඉතිහාසයක් පවතී. ආරවුල් නිරාකරණය කිරීමේ ක්‍රමයක් ලෙස සමථකරණය යොදා ගැනීමේ සම්ප්‍රදාය ශ්‍රී ලංකාවේ සංස්කෘතියේම අංගයක් ලෙස සැලකිය හැකිය. බුදුරජාණන් වහන්සේ සමථකරණ මැදිහත්කරුවෙකු ලෙසින් ගැටුම් නිරාකරණය කළ ආකාරය අතීත මූලාශ්‍රවල සඳහන් වේ. මෙම සමථකරණයට මිනිසාට තරමටම ඉතිහාසයක් පවතී. එමෙන්ම බුදුරජාණන් වහන්සේ තුන් වරක්ම ලංකාවට වැඩම කරනු ලැබුවේ ද දෙපාර්ශවයක් අතර ඇති වූ ගැටුමක් විසඳීමට වන අතර එහිදී සමථකරුවෙකු ලෙස කටයුතු කරන ලදී (සිල්වා, 2004, 15). මේ අනුව තුන්වන පාර්ශවයක් මැදිහත් වී ගැටුම් නිරාකරණයට සහය වූ අවස්ථා පිළිබඳ කීර්තිමත් ඉතිහාසයක් පවතී. අතීතය තුළ ගැටුම් නිරාකරණයට සහය වූ වැදගත් ආයතනයක් ලෙසින් ගම් සභාව හැඳින්විය හැකිය. මෙම ගම් සභාව හෙවත් ගමේ උසාවිය ගම් ප්‍රධාන පළපුරුදු මිනිසුන්ගෙන් සමන්විත විය. ඔවුහු අම්බලමක, රුප්පාවක හෝ අන්‍ය මධ්‍යස්ථානයක රැස් වී මායිම්, ණය, හොරකම්, අඬදබර ආදිය පිළිබඳ සිවිල් සහ අපරාධ ආරවුල් විසඳවුල් තීරණය කරන්නට විය. ඔවුහු දඬුවම් දීමට වඩා දෙපක්ෂය සම්මතයකට පැමිණ එකමුතුකමින් බේරීමට උත්සාහ දැරූහ (කුමාරස්වාමි, 1962, 3). ලංකාවේ ක්‍රියාත්මක කරනු ලැබූ උසාවි ක්‍රමය ද, මුල් කාලයේ පටන් ම වෙනස් වෙමින් පවත්නා එකකි. සිංහල රජ දවස මෙහි ඉතා දියුණු උසාවි පද්ධතියක් තිබූ අතර එහි ධූරාවලියේ ඉහළින්ම සිටියේ රජතුමාය. පෘතුගීසි පාලන යුගයේ දී පවා සිංහල රජ දවස තිබූ ගම්සභා වැනි අධිකරණ දිගටම පැවතුණ අතර රාජ්‍ය නිලධාරින්ගේ සමන්විත අධිකරණ හා සේනාපති අධිකරණ ද, පිහිටුවනු ලැබීය. ලන්දේසි පාලන සමයේ දී වර්ග කීපයක උසාවි තිබූ අතර අපරාධ අධිකරණ කටයුතු සඳහා ඔවුන් පාලනය කළ පෙදෙස් කලාප තුනකට බෙදී තිබිණි

[4] ශාස්ත්‍රවේදී දේශපාලන විද්‍යාව (විශේෂ), තෙවන වසර

(කොස්තා, 1985, 3-4). වර්තමාන උසාවි ක්‍රමයේ මූලාරම්භය ලන්දේසි යුගයෙන් පැවත ආ බව කිව හැකිය. මින් පසුව මැදිහත්වීම සඳහා නීත්‍යානුකූල ආයතනයක් බිහි කරන අතර එය සමගි මණ්ඩල නම් විය. අපේ රටේ ආරම්භ වුයේ, මීට වසර 42 කට පෙර සම්මත වූ 1958 අංක 10 දරණ සාම මණ්ඩල පනත මඟිනි (වන්නිආරච්චි, 2002, 25). අධිකරණයෙහි නඩු ගොඩ ගැසීමට පිළියමක් වශයෙන් 1958දී ග්‍රාමීය නායකයන්ගෙන් සැදුම්ලත් සමගිදායක මණ්ඩල නීත්‍යානුකූලව ස්ථාපිත කළ අතර එමගින් සුළු ආරවුල් හෝ සාපරාධී වරදවල් සමථකරණය කිරීම අපේක්ෂා විය. කරුණු කීපයක් හේතු කොටගෙන එනම් දේශපාලනීකරණය වීම, සාමාජිකයන්ගේ ක්‍රියාකාරීත්වය, පුහුණුවක් නොමැතිකම හා ඔවුනට වෘත්තියක් ලෙස කටයුතු කිරීමට නොහැකි වීම යන හේතුන් මත 1978 දී එම මණ්ඩල අහෝසි කරන ලදී (මුවර්, ජයසුන්දර සහ තිරනාසුකරසු, 2011, 33). මෙම තත්ත්වය අවබෝධ කර ගත් රජය 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත ගෙන එන ලදී. එම පනත් අනුව සෑම ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයක් සඳහාම සමථ මණ්ඩලයක් පත්වේ. සමථ මණ්ඩල පත් කිරීම් සහ අනෙකුත් කටයුතු කරනුයේ සමථ මණ්ඩල කොමිෂන් සභාවයි (සාලිය, 1996, 15).

## සමථ මණ්ඩල කොමිෂන් සභාව

මුළු දිවයිනේම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි පිහිටුවනු ලැබූ සමථ මූල මණ්ඩලය සියලු ක්‍රියාකාරීත්වය පාලනය කරනු ලබන්නේ සමථ මණ්ඩල කොමිෂන් සභාව තුළිනි. එය ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන පස්දෙනෙකුගෙන් යුත් සභාවකි. එයින් තිදෙනෙක් ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ ධූරය දැරූ අය වෙති. එයින් එක් අයෙක් කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත්කරනු ලැබේ (මාපා, 2001, 46). කොමිෂන් සභාවේ යම් රැස්වීමක සණ පූර්ණය සඳහා කොමිෂන් සභාවේ සමාජිකයන් තුන්දෙනෙක් සිටිය යුතු අතර කොමිෂන් සභාවේ සියලු රැස්වීම්වල මූලාසනය සභාපති විසින් දැරිය යුතුය. කොමිෂන් සභාවේ බලතල සහ කාර්යය වනුයේ සමථකරුවන් පත් කිරීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය කිරිම, සමථකරුවන් විසින් පනත යටතේ තම කාර්යයන් සහ කර්තෘව්‍ය ඉටු කිරීම අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම, සමථකාරවරුන් වෙත අවශ්‍ය විය හැකි විධාන නිකුත් කිරීම යනාදියයි. (වන්නිආරච්චි, 2002, 36). මේ අනුව පැහැදිලි වනුයේ සමථ මණ්ඩල කොමිෂන් සභාවට විශාල වගකීමක් පැවරෙන අතර එහි උපදෙස්වලට බාහිරව කිසිදු සමථ මණ්ඩලයකට ක්‍රියාත්මක වීමට නොහැකිය. යම් සමථ මණ්ඩලයක් විශේෂ කටයුත්තක් සිදු කරනුයේ නම් ඒ පිළිබඳ සමථ මණ්ඩල කොමිෂන් සභාවට දැන්විය යුතුය. එමෙන්ම යම් සමථකරුවෙකු අපක්ෂපාතී ලෙස කටයුතු කරන්නේ නම් ඒ පිළිබඳව සමථ මණ්ඩල කොමිෂන් සභාවට දැන් වූ පසු ඒ පිළිබඳ කොමිෂන් සභාවට විභාග කිරීමේ බලය හිමිවේ. මේ අනුව සමථ මණ්ඩල පනතට අනුව ප්‍රායෝගික ලෙසින් සමථ මණ්ඩල කොමිෂන් සභාව කටයුතු කරන ආකාරය දැක ගත හැකිය.

## සමථ මූල මණ්ඩලය

දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් පදනම් කර ගනිමින් සමථ මූල මණ්ඩල ඇති කර තිබේ. සමථ මණ්ඩල ප්‍රදේශයක් සඳහා කොමිෂන් සභාව විසින් සභාපතිවරයෙකු ප්‍රමුඛ සමථ මූල මණ්ඩලයක් පත් කෙරේ. එම ප්‍රදේශයේ පදිංචිව සිටින හෝ සේවයේ යෙදෙන අය සහ අදාළ පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා විසින් නම් කරනු ලබන රජයේ නිලධාරියෙකුගෙන් සමථ මූල මණ්ඩලය සමන්විත වේ. අති විශේෂ අවස්ථාවක සමථ මණ්ඩල ප්‍රදේශ හෝ පිටත පදිංචි සිටින හෝ සේවය කරන අයෙකු ද, පත් කිරීමට කොමිෂන් සභාවට බලය ඇත (සිල්වා, 2004, 26). මේ වන විට ශ්‍රී ලංකාව පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පුරා ක්‍රියාත්මක සමථ මූල මණ්ඩල 329 ක් එම පිහිටුවා ඇති සමථ මූල මණ්ඩලවල සාමාජික සංඛ්‍යාව 8425 ක් වන අතර එයින් පිරිමි සමථකරුවන් 6672ක් ද, ගැහැණු සමථකරුවන් 1753ක් වේ (කාර්යසාධන වාර්තාව, 2015).

## සමථ මණ්ඩලය

1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත මඟින් සමථ මණ්ඩලය ඇති කරන ලදී. එය ඉංග්‍රීසි භාෂාවෙන් Mediation board ලෙස හඳුන්වයි (වන්නිආරච්චි, 2002, 25). මෙම සමථ මණ්ඩලය

උසාවියක් නොවේ. එවැනි ක්‍රියාවලියක් ද, අනුගමනය නොකරන අතර ඉක්මනින්, පහසුවෙන්, අඩු වියදමකින් මෙම ගැටුම් නිරාකරණය කරනු ලබයි. මෙම සමථ මණ්ඩල ක්‍රමය හරහා පොලිසීය, උසාවිය කරා යොමුවන නඩු ප්‍රමාණය අඩුවන අතරම එහි තදබලය ද, වළක්වා ගත හැකි අතර දෙපාර්ශවයටම සාධාරණයක් ඉටුවන ආකාරයට ගැටුම විසඳා ගත හැකිය. එමෙන්ම ජනතාව අතර පවතින අසමඟිය, වෛරය, සැක සිතුවිලි ද, ඉවත්ව යයි. මේ අනුව සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස නියෝජනය වන ලෙසින් ලංකාව පුරා සමථ මණ්ඩල පිහිටුවා ඇත. එමෙන්ම මෙම සමථ මණ්ඩල සාමාජිකයින් ද, ජනතාවගේ ගෞරවයට මෙන් ම ප්‍රසාදයට ද, ලක් වේ (මාපා, 2001, 45). සමථ මණ්ඩල ප්‍රදේශයක් සඳහා කොමිෂන් සභාව විසින් සභාපතිවරයෙකු ප්‍රමුඛ සමථ මූල මණ්ඩලයක් පත් කෙරේ. එම ප්‍රදේශයේ පදිංචිව සිටින හෝ සේවයේ යෙදෙන අය සහ අදාළ පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා විසින් නම් කරනු ලබන රජයේ නිලධාරින්ගෙන් සමථ මූල මණ්ඩලය සමන්විත වේ (සිල්වා, 2004,26). මේ අනුව දිනෙන් දින සමාජය තුළ උග්‍ර වන ගැටුම්කාරී තත්ත්වයන්ට අධිකරණය හෝ පොලිසීයට නොගොස් ප්‍රභූත්වය මත සමථ කර ගැනීමට මෙම සමථ මණ්ඩලය තුළින් හැකි වේ. මෙම ආයතනය තුළින් විශාල ගැටුම් ප්‍රමාණයක් විසඳමින් පාර්ශයවන් අතර සාමය සහයෝගය මෙන්ම අන්‍යෝන්‍ය විශ්වාසය ඇති කරමින් කටයුතු කරනු ලබයි. මෙම සමථ මණ්ඩල ක්‍රමය තුළින් ග්‍රාමීය වශයෙන් ජනතාවට සිදු කරන මඟ පෙන්වීම මෙන්ම උපදෙස් සැපයීම අගය කළ යුතුය. එමෙන්ම කිසිඳු මූල්‍යමය අගයක් බලාපොරොත්තු නොවී සමථකරුවන් වන ප්‍රදේශයේ ප්‍රභූන් ලබාදෙන සේවය ද, අගය කළ යුතුය. මේ අනුව දිවයින පුරා සමථ මණ්ඩල ක්‍රමය ප්‍රායෝගික වශයෙන් ක්‍රියාත්මක වීම තුළ සමාජය තුළ පවතින ගැටුම්කාරී ස්වභාවයන් අවම කරමින් සාමකාමී සහ සහයෝගයෙන් යුතු පරිසරයක් නිර්මාණය කිරීමට හැකිවේ. මේ අනුව 80 වර්ෂවල අග භාගයේ දී ඇති වූ අදහසක බිජයකින් මතුව ආ සමථ මණ්ඩල ක්‍රමය ආරවුල් නිරාකරණයට වර්තමානයේ පුළුල් ලෙස දායක වී ඇත.

## සමථකාරවරයා යන්න හඳුනා ගැනීම.

සමථ මූල මණ්ඩලය සඳහා සමථකරුවන් 12 දෙනෙකු පත් කරනු ලැබේ. මෙම සමථකාරවරුන්ගේ කාර්යභාරය විනිසුරුවරුන්ගේ කාර්යභාරයට වඩා දුෂ්කරය. සමථකාරවරු අධිකරණයක මෙන් ලේඛකාතිවරයෙක්, නීතිඥවරයෙක් හෝ නියෝජිතයෙක් නොවන අතර අධිකරණ අමාත්‍යංශ තුළ කුසලතා සහ පුහුණුවක් ලබමින් කටයුතු කරනු ලබන පුද්ගලයෙකි. මෙම සමථකාරවරු ලෙස පත්වනුයේ අදාළ බල ප්‍රදේශයේම උගත්, බුද්ධිමත් සමාජයට සේවයක් කළ හැකි රාජ්‍ය සේවකයෙකි. ප්‍රායෝගික ලෙසින් මෙම සමථ මූල මණ්ඩලයක් අධ්‍යයනය කිරීම තුළින් දැක ගත හැකි වුයේ විශ්‍රාම ලත් විදුහල්පතිවරු, ගුරුවරුන් සහ රාජ්‍ය සේවයේ යම් උසස් තනතුරක් දැරූ පුද්ගලයින් මෙන්ම දැනට රාජ්‍ය සේවය තුළ කටයුතු කරන නිලධාරින්ගෙන් මෙම සමථ මණ්ඩලය සමන්විත වේ. මොවුන් සිය විශ්‍රාම දිවිය සමාජයට සේවයක් කිරීමේ අරමුණ පෙරදැරි කරගෙන කටයුතු කරනු ලබන අතර ස්වෙච්ඡා සේවයක් ලෙස අගය කළ හැකිය. මෙලෙස පත්වන සමථකරුවන් විසින් කළ යුතු වනුයේ අවශ්‍ය තීරණයකට එළඹීමට පාර්ශවකරුවන්ට අවශ්‍ය පහසුකම් සැපයීමයි. පාර්ශවයින් විසින් ඉදිරිපත් කරනු ලබන අනවශ්‍ය බාහිර සාධක ඉවත් කරමින් දෙපර්ශවයටම පිළිගත හැකි විසඳුමක් ලැබෙන තෙක් කටයුතු කළ යුතුය. සමථකරුවන් සිය භූමිකාව ඉටු කිරීමේ දී කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමට සිදු වේ. එහිදී විවිධ නිලධාරීන් සිය මතයට අනුව කටයුතු කරනු ලබන අවස්ථා තිබේ. එවැනි තත්ත්වයන් වළක්වාලමින් කටයුතු කිරිමට සමථකරුවෙකු සමත් විය යුතුය. එමෙන්ම පාර්ශවයන් තුළින් එල්ලවෙනු ලබන චෝදනා විඳ දරා ගනිමින් එම පාර්ශවයන් අතර සාමුහිකත්වය ඇති කිරීමට කටයුතු කළ යුතුය. තව ද, දෙපාර්ශවය අතර යම් ගැටුම්කාරී තත්ත්වයක් ඇතිවීමට මඟ පෑදෙන යමක් ප්‍රකාශ වුයේ නම් සාමදාන ලෙසින් එය වළක්වාලීමට කටයුතු කිරීමට සමථකරුවෙකුට හැකිවිය යුතුය. මේ අනුව සමථකරුවෙකුගේ භූමිකාව ගැටුමක් නිරාකරණය කිරිමට ඉතාම වැදගත් වේ.

සමථකරුවෙකුගේ සුදුසුකම් පිළිබඳ අධ්‍යයනය කිරීමේදී, මෙම සමථකාරවරු අදාළ ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු වීම, අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් වීම, ප්‍රදේශයේ ජනතාව අතර ගෞරවයක් පිළිගැනීමක් ලබා තිබීම සහ වයස අවුරුදු 18 ට වැඩිවීම යන මූලික සුදුසුකම් සපුරා ඇති අයගේ නාමයෝජනා සලකා බලා සමථ මණ්ඩල කොමිෂන් සභාව මඟින් සම්මුඛ

පරීක්ෂණයකින් අනතුරුව පුහුණු පාඨමාලාව සඳහා සුදුසු තැනැත්තන් තෝරා ගනු ලැබේ. ඉන්පසුව ඒ අය සඳහා දින 5 ක විශේෂිත පුහුණුවක් අධිකරණ අමාත්‍යාංශයේ සමථ පුහුණු නිලධාරීන් විසින් ලබාදෙන අතර එහි වාර්තා සැලකිල්ලට ගෙන සමථකරුවන් තෝරා ගනියි. අවුරුදු 03 කාලයක් සඳහා පත්වන සමථකරුවන් එම කාලය අවසන් වූ පසු නවකයන් බඳවා ගනු ලබන අතර අවුරුදු 18 ඉක්ම වූ ඕනෑම ශ්‍රී ලංකා පුරවැසියෙකුට සමථ මණ්ඩල සාමාජිකත්වය ලබා ගත හැකිය (තෙන්නකෝන්, 2012, 175). මෙයට අමතරව අතිවිශේෂ අවස්ථාගත කරුණුවලදී සුදුසු යැයි කොමිෂන් සභාව තීරණය කරන්නේ නම්, ඒ සමථ මණ්ඩල ප්‍රදේශයෙන් පිටත පදිංචිව සිටින හෝ ඒ ප්‍රදේශයෙන් පිටත යම් වැඩක යෙදී සිටින යම් තැනැත්තෙක් සහ ඒ සමථ මණ්ඩල ප්‍රදේශය පිහිටියේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක් ඇතුළත ද, ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා විසින් නම් කරනු ලබන යම් රජයේ නිලධාරියෙක් සමථ මණ්ඩලයට පත් කරනු ලැබීමට සුදුසුකම් වන්නේය (1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත). මෙම සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකුට සමථ මණ්ඩලය සඳහා සමථකාරවරයෙකු ලෙස පත්වීමට හැකිය. සමථ මණ්ඩල සාමාජිකයන් වීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකමක් නියම කර නොමැති අතර ඇතැම් පළාත්වල ඉතා අඩු සුදුසුකම් ඇති සාමාජිකයන් පත් කර ඇත. පනත මඟින් එවැනි ඉඩකඩ සලසා ඇත්තේ ශ්‍රී ලංකාවේ සෑම පරිපාලන කොට්ඨාසයකම එක හා සමාන අධ්‍යාපන මට්ටමක් නොවන බව පිළිබඳව අවධානය යොමු කර ඇති බැවිණි. මේ අයුරින් සුදුසුකම් සපුරනන් සමථ මණ්ඩල සඳහා සාමාජිකයන් ලෙස පත් කර ගනු ලබයි. රැකියාව අනුව ද, සමථකාරවරු වර්ගීකරණයට ලක් කළ හැකිය. මෙහිදී විවිධ ස්ථානවල රැකියාවේ නියුතු හා විශ්‍රාම ලත් පුද්ගලයින් බොහෝ දෙනෙක් සමථකරුවන් වශයෙන් කටයුතු කරනු ලබයි. මේ අනුව වෘත්තීන් අනුව සමථ මණ්ඩලය තුළ සමාජිකත්වය ලබා ගත් අකාරය පහත පරිදි දැක්විය හැකිය.

වගු අංක 01: වෘත්තිය අනුව සාමාජිකත්වය

| අනු අංකය | වෘත්තිය | ප්‍රතිශතය |
|---|---|---|
| 01 | ගුරු | 19.6% |
| 02 | වෛද්‍ය | 2.4% |
| 03 | ව්‍යාපාරික | 6.25% |
| 04 | විශ්‍රාමික | 36.2% |
| 05 | රජයේ රැකියා | 10.1% |
| 06 | ස්වයං රැකියා | 3.1% |
| 07 | ගොවි | 13.1% |
| 08 | බම්කරු | 0.4% |
| 09 | වෙනත් | 8.8% |

මූලාශ්‍රය : ඒකනායක, 2001, 19

වයස අනුව, සමථ මණ්ඩල තුළ සාමාජිකත්වය හිමි කරගෙන තිබෙනුයේ මෙලෙසිනි. වයස අවුරුදු 70ට වැඩි පිරිස 1.1% ක් ද, වයස අවුරුදු 40ට අඩු 10.5% ක් ද, වයස අවුරුදු 41 සිට 50 දක්වා 26.8% ක් ද, වයස අවුරුදු 51 සිට 61.8%ක් ලෙස සාමාජිකත්වය ලබාගෙන තිබේ (ඒකනායක, 2001, 22). මේ අනුව සමථ මණ්ඩලය තුළ සාමාජිකත්වය හිමි කර ගැනීමේ දී විවිධ වෘත්තීන්වල පිරිස මෙන්ම ආගම අනුව ද, වයස අනුව ද, විවිධ මට්ටම්වල පිරිස් සමථකරණ ක්‍රියාවලියට සම්බන්ධ වී ඇති බව උක්ත දත්ත අනුව පැහැදිලි කර ගත හැකිය.

සමථකරුවන් සතුව පවතින ගුණාංග පිළිබඳ විමසීමේ දී මධ්‍යස්ථ හා අපක්ෂපාතීවීම, පාර්ශවයන්ට සම අවස්ථා ලබාදීමට හැකිවීම, රහස්‍යභාවය පවත්වාගෙන යාම, එළිදියි ලෙස සන්නිවේදනය කිරීම, පාර්ශවයන් අතර විශ්වාසය ඇති කිරීම, ඉවසීම, අවංකභාවය (මුවර්, ජයසුන්දර සහ තිරනාවුකරසු, 2011, 92-93). මැදිහත්කරුවෙකු ලෙස කටයුතු කරනු ලබයි. එහිදී මැදිහත්කරු මාර්ගෝපදේශකයෙකි. මිතුරෙකි. ආරවුලකට හෝ ගැටුමකට සම්බන්ධ පර්ශවකරුවන්ට ඉතා

සංවේදීව සවන් දී ඉවසීමෙන් යුතුව ගැටුම සමථකරණයට අවශ්‍ය මැදිහත්වීම සිදු කරනු ලබයි. එමෙන්ම සමථකරු ඉවසිලිවන්ත සහ අවංකභාවයෙන් යුක්ත විය යුතුය. එමෙන්ම රහස්‍යභාවය උපරිම ලෙස රැකීමට සමථකරු සමත්විය යුතුය. එනම් සිය පෞද්ගලික ගැටුමක් ප්‍රසිද්ධියට ලක්වනවාට කිසිඳු ආරවුල්කරුවෙකු කැමති නොවේ. එවැනි අවස්ථාවල දී, එම රහස්‍යභාවය ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතුය. එමෙන්ම පාර්ශව දෙකටම සම අවස්ථා ලබා දීම සිදු කළ යුතුය. එවිට දෙපාර්ශවයටම සාධාරණ ලෙසින් සමව අදහස් ඉදිරිපත් කළ හැකිය. මීට අමතරව සුහදශීලී වීම, සාධාරණත්වය, අපක්ෂපාතී අයෙකු වීම, සාකච්ජාවක් ගොඩනැංවීමේ හැකියාව, පූර්ව නිගමනවලින් තොරවීම, නිවැරදි ප්‍රවේශය තෝරාගත හැකි වීම යන ගුණංග ද, සමථකරුවෙකු සතු විය යුතුය (තෙන්නකෝන්, 2012, 174). මෙහිදී සමථකරු පාර්ශව දෙක කෙරෙහිම ඉතා සුහදශිලී පුද්ගලයෙකු ලෙස කටයුතු කරමින් එම පාර්ශවවලට තමා පිළිබඳ විශ්වාසයක් ගොඩනැගිය යුතුය. එමෙන්ම සාධාරණත්වයට උපරිම තැන ලබා දිය යුතුය. එක් පාර්ශවයකටවත් අසාධාරණයක් සිදු නොකර සාධාරණ ලෙසින් කරුණු සලකා බලමින් ගැටුම විසඳිය යුතු අතරම අපක්ෂපාතී විය යුතුය. එනම් එක් පාර්ශවයක්වත් සාධාරණීකරණය නොකර එම පාර්ශවවලට ගැටුම පිළිබඳ සාකච්ජා කිරිමට ඉඩ ලබා දී මැදිහත්වීම සිදු කළ යුතුය. මෙහිදී එක් පාර්ශවයක් නිවැරදි ලෙස පවසා එයට හේතු ඉදිරිපත් කිරිමේ හැකියාවක් සමථකරුවෙකුට නොමැත. සාකච්ජා ගොඩනංවන්නෙක් ලෙස ගැටුමට මූල හේතු පාර්ශව තුළින්ම ලබා ගැනීමට කටයුතු කරමින් පාර්ශවවලට සාකච්ජා මාර්ග විවෘත කර දීම සිදු කළ යුතුය. සමථකරු පූර්ව නිගමනවලින් තොරවිය යුතුය. සමථකරුවන් අදාළ ගැටුම පිළිබඳ මුලින් සාකච්ජා කර නිගමනවලට එළඹ පසුව එය තහවුරු කිරීමට කටයුතු නොකළ යුතුය. සියලු අදහස් ලබා ගත යුත්තේ අදාළ පාර්ශව හරහාය. එමෙන්ම ගැටුමට ප්‍රවේශවීමේ දී ප්‍රවේශවීමට අදාළව නිවැරදිම කරුණු පිළිබඳ සැලකිලිමත් වී කටයුතු කළ යුතුය. මෙවැනි ගුණාංගවලින් යුතුව සමථකරුවෙකු කටයුතු කරන්නේ නම් සමථකරණ ක්‍රියාවලිය සාර්ථක කර ගත හැකිය.

සමථ මණ්ඩලයක් තුළ සිය ක්‍රියාකාරීත්වය ගෙන යාමේ දී සමථකරුවන් කළ යුතු සහ නොකළ යුතු දෑ පිළිබදව සඳහන් කර ඇත. මෙහිදී කළ යුතු දෑ විමසිමේ දී ස්වයං තීරණ ගැනිමේ මූලධර්මවලට අනුකූලව යන ආකාරයෙන් සමථකරණ ක්‍රියාවලිය අනුගමනය කර පවත්වාගෙන යාම දැක්විය හැකිය. එයට අමතරව සමථකරුවෙකු විසින් කළ යුතු දෑ ලෙෂ පාර්ශවයින් විසින් ගන්නා ලද තීරණයකට හෝ විසඳුමකට ඒමට ඔවුන්ට පහසුකම් සැලසීම, සියලුම පාර්ශවයන්ට මධ්‍යස්ථවීම, පාර්ශවයන්ගේ අපේක්ෂාවන් පරිදි රහස්‍යභාවය පවත්වාගෙන යාම, පාර්ශවයන්ගේ අදාළ නොවන යම් උවමනාවන් පිළිබඳව සැලකිලිමත් වීමෙන් වැළකීම, සමථකරණයට නොගැළපෙන දේ ඉවත් කිරීම, පාර්ශවයන් සැලකිලිමත් වන දේ පිළිබඳව පුළුල් අවස්ථාවන් ලබාදීමට ඉවසිලිවන්තවීම, සාකච්ජාවේ දී එකඟත්වයට පත් වූ කරුණුවලින් බැහැරව සාකච්ජාව යොමුවන විට කාලය අපතේ නොයැවීම යනාදිය දැක්විය හැකිය(මුවර්,ජයසුන්දර සහ තිරනාවුකරසු, 2011, 91). එසේම සමථකරු, සමථකරණ ක්‍රියාවලිය පවත්වාගෙන යාමේ දී පාර්ශව දෙක කෙරෙහිම අවධානය යොමු කරමින් දෙපාර්ශවයටම සාධාරණයක් ඉටු කළ යුතු අතර යම් පැමිණිල්ලක් සම්බන්ධයේ කරුණුවල රහස්‍යභාවය ආරක්ෂා කරමින් ඔවුන්ගේ ආත්ම ගරුත්වය හානි සිදුවන කරුණු පිළිබඳව සැලකිලිමත් වී ඒවා වෙනත් පිරිසක් දැන ගැනීමෙන් වැළකිය යුතුය. ගැටුමට අවශ්‍ය නොවන යම් කාරණා ඉදිරිපත් වේ නම් එම කාරණා යටපත් කරමින් කටයුතු කළ යුතුය. ගැටුම සමථකරණය කරන අවස්ථාවල පාර්ශවකරුවන් ඉදිරිපත් කරන කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර එහිදී පාර්ශව බොහෝ ලෙස සැලකිලිමත් වන දෑ පිළිබඳව වැඩි අවධානයක් යොමු කර ඒවා ලබා දීමට කටයුතු සැලසිය යුතුය. තවද, සමථකරු සාකච්ජා සිදු කර එයින් විසඳුමකට එළඹුණු පසු ද, වෙනත් බාහිර කාරණා සම්බන්ධව සාකච්ජාවලට යොමුවන්නේ නම් එයින් වැළකිය යුතුය.


සමථකාරවරයෙකු නොකළ යුතු දෑ විමසීමේ දී නීති උපදෙස් දීම, පාර්ශවයන් සඳහා තීරණදීම, ආරවුලේ එකඟතා කොන්දේසිවලින් වාසි ලබා ගැනීම හෝ සිය පුද්ගලික උවමනාවන් ඉටු කර ගැනීමට උත්සාහ දැරීම, ආඥාදායක ප්‍රවේශය, බලහත්කාර තර්ජනය, පෙළඹවීම, භය ගැන්වීම හෝ වෙනත් නීත්‍යානුකූල නොවන මාර්ගවලින් ගිවිසුමක් සඳහා පාර්ශවයන් යොමු කිරීම, සමාජ වෙනස්කම් මත වෙනස් ලෙස සැලකීම හෝ ඒ මත පදනම් වූ තීන්දු ප්‍රකාශයට පත්කිරීම සහ කවරාකාරයේ ගෙවීමක් හෝ වන්දි ලබා ගැනීම සිදු නොකළ යුතුය(මුවර්,ජයසුන්දර සහ

තිරනාවුකරසු, 2011, 91-92). මේ ආකාරයෙන් සමථකරුවෙකු සිය භූමිකාව ඉටු කිරීමේ දී කළ යුතු දේ නිසි පරිදි කරමින් නොකළ යුතු දෑ වලින් ඉවත් වෙමින් කටයුතු කිරීම සැබෑ සමථකරුවෙකුගේ වගකීමකි.

## සමථ මණ්ඩලය වෙත ආරවුල් ඉදිරිපත් කිරීම සහ විසඳීම

සමථ මණ්ඩලය වෙත ආරවුල් ඉදිරිපත් කිරීම මෙන් ම ඒවා සමථකරණයට ලක් කර ගත හැකිය. ඒ අනුව සමථ මණ්ඩලය වෙත පැමිණිලි ඉදිරිපත් කිරීමේ දී විවිධ වූ ස්වභාවයේ ආරවුල් ඉදිරිපත් කළ හැකිය. මේ අනුව උසාවියේ සහ අධිකරණයේ පවතින තදබදය අවම කරමින් පාර්ශව දෙකකට සමථකරණයට එළඹිය හැකි ගැටුම් සමථ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබයි. මෙහිදී පොලිසිය, උසාවිය, මූල්‍ය ආයතනවලින්, ග්‍රාමනිලධාරී සහ පෞද්ගලිකව පැමිණිලි ඉදිරිපත් කළ හැකිය. අසල්වැසියන් අතර ගුටිබැට හුවමාරු දක්වා වර්ධනය වුණු සුළු ආරවුල් එනම් මූල්‍ය ආරවුල්, ඉඩම් ආරවුල්, පවුල් ආරවුල්, පහරදීම් සම්බන්ධ ආරවුල්, ආපසු නොගෙවන ලද ණය තුරස් පිළිබඳ ආරවුල් ආදිය සමථකරණය කර ගැනීමට සමථ මණ්ඩලය වෙත යොමුවේ. ආරවුලේ ස්වභාවය අනුව සමථ මූල මණ්ඩලවලට ආරවුල් යොමු කිරීම පහත පරිදි කළ හැකිය.

ප්‍රස්තාර 01 : 2013 සමථ මණ්ඩලයට ලැබුණු ආරවුල්වල ස්වභාවය




මූලාශ්‍රයඃ කාර්යසාධන වාර්තාව, 2013

මෙම ප්‍රස්තාරයට අනුව සමථ මණ්ඩලය තුළට අධිකරණය, පොලිසිය, බැංකු සහ රක්ෂණ ආරවුල්කරුවන්, ආරවුල්කරු සහ විසඳුම්වලට අදාළ කොන්දේසි උල්ලංඝනය කිරීම හෝ කඩ කිරීම සම්බන්ධයෙන් වූ ආරවුල් ඉදිරිපත් කර ඇත. මෙහිදී බැංකු සහ රක්ෂණ ආයතනවලින් ඉදිරිපත් වන ආරවුල් ඉහළ මට්ටමක පවතී. එය 47%ක ප්‍රමාණයකි. පොලිසිය විසින් සමථ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ආරවුල් දෙවනුවට ඉහළ මට්ටමක පවතී. එමෙන්ම අධිකරණය සහ ආරවුල්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන ආරවුල් පහළ මට්ටමක පවතින අතර විසඳුම්වල කොන්දේසි උල්ලංඝනය කිරීම හෝ කඩ කිරීම පිළිබඳව ආරවුල් ඉදිරිපත් වී ඇත්තේ ඉතා අඩු මට්ටමකට වන අතර එය 2% ක ප්‍රමාණයකි.


වගු අංක 02 : 2016 ඉදිරිපත් ඇති ආරවුල්වල ස්වභාවය

| අනු අංකය | සංරචකය | ආරවුල් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | උසාවියෙන් | 13196 |
| 02 | පොලීසියෙන් | 43578 |
| 03 | බැංකු මූල්‍ය ආයතනවලින් | 91345 |
| 04 | ආරවුල්කරුවන්ගෙන් | 2758 |
| 05 | කළින් එළඹි එකඟතා | 14968 |
| 06 | එකතුව | 165845 |

මූලාශ්‍රයː සමථ මණ්ඩල කොමිෂන් සභා වාර්තා, 2016

මෙම වගුවට අනුව 2016.01.01 දින සිට 2016.09.30 දින දක්වා සමථ මූල මණ්ඩලයට ඉදිරිපත් කරන ලද ආරවුල් පිළිබඳ විමසීමේ දී වැඩි ආරවුල් ප්‍රමාණයක් ඉදිරිපත් වී ඇත්තේ බැංකු මූල්‍ය ආයතනවලින් ය. දෙවනුව පොලීසියෙන් වැඩි ආරවුල් ප්‍රමාණයක් සමථ මණ්ඩල වෙත ඉදිරිපත්ව ඇත. කළින් එළඹි එකඟතා සහ උසාවියෙන් ද, යම් ප්‍රමාණයකින් ආරවුල් ඉදිරිපත් වී ඇති අතර මෙහිදී අඩු ප්‍රමාණයක් ආරවුල්කරුවන්ගෙන් ඉදිරිපත් වී ඇත. මේ අනුව සමථ මණ්ඩලය වෙත සමස්ත ආරවුල් 165845 ක් ඉදිරිපත් වී ඇත.

ප්‍රස්තාර අංක 02ː පළාත් මට්ටමින් සමථ මණ්ඩලය වෙත ආරවුල් ලැබීම




මූලාශ්‍රයː කාර්යසාධන වාර්තා, 2015

මෙම ප්‍රස්තාරයට අනුව එක් එක් පළාත් අනුව ආරවුල් සමථ මණ්ඩල තුළට ලැබුණු ප්‍රමාණය ඉදිරිපත් කර ඇත. එහිදී වැඩිම ආරවුල් ප්‍රමාණයක් ලැබී ඇත්තේ බස්නාහිර පළාතයට අයත් සමථ මණ්ඩල තුළිනි. එමෙන් ම මෙම ප්‍රස්තාරයට අනුව මධ්‍යම පළාත, දකුණු පළාත සහ වයඹ පළාත තුළ සමථ මණ්ඩල තුළින් දෙවනුවට ආරවුල් ඉදිරිපත්වීම ඉහළ මට්ටමක පවතී. උතුරු මැද පළාත, සබරගමුව පළාත සහ නැගෙනහිර පළාතේ සමථ මණ්ඩල විසින් මධ්‍ය මට්ටමින් ආරවුල් ඉදිරිපත් කර ඇත. එමෙන්ම උතුරු පළාත සහ ඌව පළාතේ සමථ මණ්ඩල තුළින් ආරවුල් ඉදිරිපත්වීම අඩු මට්ටමක පැවත ඇත. මේ අනුව අනෙකුත් පළාත්වලට සාපේක්ෂව 2013 වර්ෂයේ ආරවුල් ඉදිරිපත්වීම බස්නාහිර පළාත තුළ ඉහළ මට්ටමක පවතී. ආරවුල් ඉදිරිපත් කිරීම අඩුම මට්ටමක පවතිනුයේ ඌව පළාත තුළය.

වගු අංක 03: 2015.01.01 දින සිට 2015.12.31 දින දක්වා ප්‍රගතිය

| අනු අංකය | සංරචකය | ආරවුල් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | සමථ මණ්ඩල වෙත යොමු කිරීම් | 191,543 |
| 02 | සමථයට පත් කිරීම් | 91,646 |
| | ප්‍රතිශතය | 47.85% |

මූලාශ්‍රය : කාර්යසාධන වාර්තාව, 2015

මෙම වගුවට අනුව දිවයිනේම සමථ මණ්ඩල වෙත 2015 වර්ෂයේ මුල සිට වර්ෂය අවසානය දක්වා ඉදිරිපත් වූ ආරවුල් සංඛ්‍යාව දක්වා ඇත. ඒ අනුව 191,543 ආරවුල් ප්‍රමාණයක් ඉදිරිපත් කර ඇත. එම ආරවුල් අතුරින් සමථයකට පත් වූ ආරවුල් ප්‍රමාණය 91,646ක් වන අතර එය ප්‍රතිශතයක් ලෙස 47.85%ක ප්‍රමාණයකි. සමස්තයක් ලෙස ගත්විට මෙම වගු සටහනට අනුව සාමාන්‍ය මට්ටමකින් සමථ මණ්ඩල වෙත ඉදිරිපත් කරන ලද ආරවුල් සමථයකට පත් කිරීමට හැකි වී තිබෙන බව සඳහන් කළ හැකිය.

වගු අංක 04: 2016 ආරවුල් නිරවුල් කිරීම

| අනු අංකය | සංරචකය | ආරවුල් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | පැමිණි ආරවුල් සංඛ්‍යාව | 165845 |
| 02 | නිරවුල් කළ ආරවුල් සංඛ්‍යාව | 69338 |
| 03 | නිරවුල් නොකළ ආරවුල් සංඛ්‍යාව | 64115 |
| 04 | නිරවුල් කිරීමට ඉතිරි ආරවුල් සංඛ්‍යාව | 32392 |

මූලාශ්‍රය : සමථ මණ්ඩල කොමිෂන් සභා වාර්තා, 2016

වගුවට අනුව 2016.01.01 දින සිට 2016.09.30 දින දක්වා සමථ මූල මණ්ඩල වෙත ලැබුණු ආරවුල් සංඛ්‍යාව අතුරින් නිරවුල් කළ ප්‍රමාණය 69338ක් වන අතර නිරවුල් නොකළ ප්‍රමාණය 64115කි. එමෙන්ම එතුළින් නිරවුල් කිරීමට ඉතිරි වූ ආරවුල් ප්‍රමාණය 32392ක් වේ. නිරවුල් කිරීමට ගනු ලබන ආරවුල් අතුරින් ද, නිරවුල් කිරීමට හැකි ආරවුල් පමණක් නිරවුල් කරන අතර එහිදී නිරවුල් කිරීමේ සහතිකයක් ලබාදෙනු ලබයි. නිරවුල් නොකිරීමේ ආරවුල් සඳහා නිරවුල් නොකිරීමේ සහතිකයක් ලබාදෙනු ලබයි. මේ අනුව සමථ මණ්ඩල වෙත ඉදිරිපත් වන ආරවුල් අතුරින් බොහෝ ප්‍රමාණයක් විසඳා ගැනිමට එම ආයතනයට හැකි වී තිබෙන බව මෙතුළින් පැහැදිලි වේ.


## සමථකරණයේ ප්‍රතිලාභ

ගැටුමක් සමථකරණය කර ගැනීමට උසාවිය, අධිකරණය වෙත යොමුවීම තුළින් ගැටුමක් විසඳා ගැනීමට යාමේ දී පරම්පරා ගණනක් යන තුරු එහි තීරණය වෙනුවෙන් බලා සිටීමට සිදුවේ. මෙම අධිකරණ පද්ධතියට පෙර ගැටුම සමථකරණය කර ගැනීමේ අරමුණින් සමථ මූල මණ්ඩලය වෙත යොමුවීම තුළින් ප්‍රතිලාභ රැසක් ලබා ගැනීමට ගැටුම හා සම්බන්ධ දෙපාර්ශවයට හැකිවේ. පාර්ශවයන්ට අත්වන ප්‍රතිලාභ නම් වැයවන වියදම ඉතාම අඩුය, කාලය ඉතාම කෙටිය, අදාළ පාර්ශවයන්ට විවෘතව නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබේ, ජය ජය විසඳුමක් සියලු පාර්ශවයන්ට උදාකර ගත හැකිය, බිඳුණු සබඳතා නැවත ගොඩනැගේ, වෛරය, ක්‍රෝධය වැනි චේතනාවන් ඇති නොවේ, ආරවුලේ මූල බීජය සොයා එය නැවත ඇති නොවන අයුරින් එයට පිළියම් යෙදිම, දෙපාර්ශවයටම සතුටුවිය හැකි දීර්ඝකාලීන විසඳුමකට මඟ පෑදේ (තෙන්නකෝන්, 2012, 174). අදාළ පාර්ශවයන්ට නිදහසේ සිය අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබාදීම ද, සමථ මූල

මණ්ඩලයෙන් ලැබෙන ප්‍රතිලාභයකි. පාර්ශවකරුවන්ට සිය සිත් තුළ පවතින හැඟීම් ප්‍රකාශ කිරීමට මේ තුළින් අවස්ථාව හිමි වේ. එතුළින් එක් පාර්ශවයක් අනෙක් පාර්ශවය කෙරෙහි පවතින වෛරය, ක්‍රෝධය වැනි සිතුවිලි අවබෝධ කර ගැනීමට හැකි වන අතර එවිට සමථකරුට එම තත්ත්වයන් මැඩ පැවැත්වීමට හැකිය. එමෙන්ම අදාළ පාර්ශවයන්ට මානසික සැහැල්ලුවක් ද, මෙතුළින් ඇතිවේ. එයට හේතු වනුයේ අධිකරණ පද්ධතියක මෙන් නොව සමථ මණ්ඩලය තුළ දී තමාට අවශ්‍ය අයුරු ගැටුම සම්බන්ධයෙන් කතා කිරීමට අවස්ථාව ලබාදීමයි. එමෙන්ම පාර්ශව දෙකටම ජය අත්වන අවසානයක් ලබා ගත හැකිය. වෙනත් ආයතන වෙත යොමුවීමේ දී එක් පාර්ශවයකට පමණක් ජය අත්වේ. නමුදු මෙම ක්‍රියාදාමය තුළින් පාර්ශව දෙකටම ජය අත්වන අතර බිඳුණු සබඳතා යළි ගොඩ නංවා ගැනීමට ද මෙය අවස්ථාවක් වේ. එමෙන්ම මේ හරහා දෙපාර්ශවය අතර හොඳ හිත ද වර්ධනය වේ. එමෙන්ම වෛරය පළිගැනීම වැනි චේතනාවන් යළ ඇති නොවන ලෙසින් සමථකරණයට හැකිවේ.

පාර්ශවකරුවන්ට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම තුළ ආරවුලේ මූල බීජය සොයා එය නැවත ඇති නොවන පරිදි එයට අවශ්‍ය පිළියම් යෙදීමට සමථකරුවන්ට මේ හරහා අවස්ථාව ලැබේ. එයද ගැටුමේ පාර්ශවකරුවන්ට සමථ මණ්ඩලය හරහා ලැබෙන ප්‍රතිලාභයකි. තව ද, මෙතුළින් ලැබෙන ප්‍රතිලාභයක් ලෙසින් දෙපාර්ශවයටම සතුටු විය හැකි දීර්ඝකාලීන විසඳුමකට ගමන් කිරීමට හැකිවන අතරම සහයෝගීතාවයෙන් ප්‍රශ්න විසඳා ගැනීමට ද, හැකිවේ. එමෙන්ම මේ හරහා පොලිසීය සහ අධිකරණය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමේ දී එයට බොහෝ කාලයක් ගත වන අතරම මුදල් ද වැයවේ. නමුදු සමථ මූල මණ්ඩලය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමේ දී වැය වනුයේ රුපියල් 5 ක් වැනි සුළු මුදලකි. ආරවුල් සම්බන්ධයෙන් තමා විසින් කරනු ලබන ඉල්ලීම කෙටියෙන් සඳහන් කොට අදාළ පාර්ශවයන්ගේ නම් සහ ලිපිනයන් ද, සමඟ රු.5 ක මුද්දරයක් අලවා එය අවලංගු නොකොට මූල මණ්ඩලයේ සභාපතිවරයා වෙත තැපැලෙන් හෝ අතින් හෝ භාරදිය යුතුය (චන්ද්‍රසේන, 1998, 22). සමස්ත පැමිණිල්ල ඉදිරිපත් කිරීමේ සිට එය අවසන් වන තුරු වැයවන මුදල එපමණක් වේ. මෙය ජනතාවට ලැබෙන විශේෂ ප්‍රතිලාභයකි. එමෙන්ම ඉතා කෙටි කාලයක් තුළ ගැටුම සමථකරණයට ලක් කරන අතර එම කාලය උපරිම දින 60 කි. දින 60 ක් ගතවීමෙන් පසු නිරවුල් කිරීමේ හෝ නොකිරීමේ සහතිකයක් ලබාදෙනු ලැබේ. එමෙන්ම ආරවුල්කරුවන්ට නීතිඥයකු මඟින් පෙනී සිටීම අයිතිවාසිකමක් හෝ අවසරයක් නොමැති හෙයින් නීතිඥ ගාස්තු වශයෙන් වියදමක් දැරීමට සිදු නොවන හෙයින් මෙම ක්‍රියාමාර්ගය වියදම් අධික නොවන එකක් ද, වන්නේය (චන්ද්‍රසේන, 1998, 12).පහත ප්‍රස්ථාරයෙන් සමථකරණය භාවිතා කළ තැනැත්තන් එහි දුටු ප්‍රතිලාභ දැක් වේ

ප්‍රස්තාර අංක 03: සමථකරණය යොදාගත් තැනැත්තන් සමථකරණයේ දුටු ප්‍රතිලාභ




මූලාශ්‍රය : ගුණවර්ධන, 2011, 21

මෙම ප්‍රස්තාරය 2010 පවත්වන ලද සමථ මණ්ඩල වැඩසටහන පිළිබඳව ඇගයීමෙන් ලබා ගත් දත්ත පදනම් කරගෙන නිර්මාණය කරන ලද්දකි. ඒ අනුව ප්‍රතිචාර දැක්වූ පිරිසට 350 දෙනෙකු අතුරින් 327 අඩු කාලයක් තුළ ආරවුල විසඳා ගැනීමට හැකි වූ බවට ඉදිරිපත් කළ අතර 258 දෙනෙකු අඩු වියදමින් ආරවුල් විසඳා ගැනීමට හැකි බව ඉදිරිපත් කර ඇත. එමෙන්ම වඩා සාධාරණ ක්‍රියාවලියක් බවට 158 දෙනෙකු ප්‍රතිචාර දක්වා ඇත. පාර්ශවයන් අතර සම්බන්ධතාවය වැඩි දියුණු වන බවට 135 දෙනෙකු ප්‍රතිචාර දක්වා ඇත. වඩා සාධාරණ විසඳුමක් ලැබෙන බවට 126 දෙනෙකු ද, වෙනත් අදහස් දැක් වූ ප්‍රතිචාරකයින් 22ක් ද, සමථ මණ්ඩලයෙන් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ කිසිදු අදහසක් නොමැති 16 දෙනෙකු ද, මෙම අදහස් දැක් වූ අය අතර විය. මෙම සමස්ත ප්‍රතිචාරීන් අනුව සමථ මණ්ඩලයෙන් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව ඉතා ඉහළ ප්‍රතිචාර දක්වා ඇති බව පැහැදිලි වේ. මේ අනුව සමථ මණ්ඩල ක්‍රමය හරහා අනෙකුත් අධිකරණ ක්‍රමවලට වඩා ප්‍රාදේශීය ජනතාව වෙනුවෙන් බොහෝ ප්‍රතිලාභ අත් කර දෙන බව මෙතුළින් පැහැදිලි වේ.

## සමථ මූල මණ්ඩලයේ පවතින ගැටලු

සමථ මූල මණ්ඩලයක් ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රියාත්මවීමේ දී එයට බොහෝ ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ පෑමට සිදු වී ඇත. සමථ මණ්ඩල මුහුණ දෙනු ලබන එක් ප්‍රධානතම ගැටලුවක් වනුයේ ද්‍රවිඩ භාෂාව කතා කරන පුහුණුකරුවන් නොමැතිවීමයි. ආසියා පදනම විසින් සමථකරණ පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීමට සහය වන ලදී. ශ්‍රී ලංකාව එබඳු මුල්ම පුහුණු කිරීමේ මධ්‍යස්ථානය වන අතර එහි භාෂා තුනෙන්ම එනම් සිංහල, ද්‍රවිඩ සහ මුස්ලිම් කාර්ය මණ්ඩලයක් ඇත. 2004 සිට මධ්‍යස්ථාන විසින් ද්‍රවිඩ භාෂාව කතා කරන පුහුණුකරුවන් 14 දෙනෙකු පුහුණු කර ඇත. ඔවුන් විසින් සමථකරුවන් 1500 කට අධික සංඛ්‍යාවක් නේවාසිකව පුහුණු කර ඇත (වික්‍රමනායක, 2011, 29). මෙලෙස පුහුණුවක් ලබා දුන්න ද සමථ මණ්ඩලවලට අවශ්‍ය කරනු ලබන ද්‍රවිඩ භාෂා හෝ මුස්ලිම් භාෂා කතා කරන සමථකරුවන් නොමැත. එම නිසාවෙන් ගැටුම් නිරාකරණයේ දී එම පාර්ශවයන් අපහසුතාවයට පත් වේ. එමෙන්ම සමථ මණ්ඩලය මුහුණ දෙනු ලබන ගැටලුවක් වනුයේ සමහර අවස්ථාවන්හී දි සාකච්ඡාවක් සඳහා සමථ මණ්ඩලය ඉදිරියට පැමිණීමට පාර්ශවය දක්වන අකමැත්ත සහ ප්‍රතික්ෂේප කිරීමයි (විජයතිලක, 2011, 20). මෙම තත්ත්වය බොහෝ දුරට දැක ගත හැකි අතර එක් පාර්ශවයක් නොපැමිණීම තුළ ගැටුම සමථකරණය කිරීමට නොහැකිය. සමථ මණ්ඩලය විසින් පාර්ශවකරුවන් වෙත ආරවුල සම්බන්ධයෙන් විස්තර සඳහන් කර ලිපියක් යොමු කරන අතර එහිදී ත්‍රිත්ව දැනුම් දීමකින් පසුව ද, සමථ මණ්ඩලය මඟ හරිනු ලබන පාර්ශවයන් සිටිති. අතීතය තුළ මෙය ප්‍රබල ගැටලුවක් බවට පත්විය. නමුදු වර්තමානය තුළ මෙලෙස සමථ මණ්ඩලයට නොපැමිණෙන පාර්ශවයන් ග්‍රාම නිලධාරී මාර්ගයෙන් ගෙන්වා ගැනීමට කටයුතු කරනු ලබයි. එමෙන්ම සමථ මණ්ඩලය පවත්වාගෙන යනු ලැබීමට ගොඩනැගිලි නොමැතිකම ද, ගැටලුවකි. දැනට වැඩි වශයෙන් සමථකරණ කටයුතු සඳහා යොදාගෙන ඇත්තේ රජයේ පාඨශාලාවන්ය. සති අන්ත දිනවල එම පාසල්වල කෙරෙන විවිධ කටයුතු නිසාත් ආරවුල්කරුවන් පැමිණීමෙන් පාසල් ගොඩනැගිලිවලට සිදුවන හානි නිසා ඇතැම් විදුහල්පතිවරුන් පාසල් ගොඩනැගිල්ල ලබාදීම ප්‍රතික්ෂේප කරයි (ඒකනායක, 2001, 45). සමථ මණ්ඩලයක් ස්ථාපිත කිරීමේ දී එය ස්ථිර ස්ථානයක පැවතීම වැදගත්. එසේ නොවේ නම් එය සංචාරක සමථ මණ්ඩලයක් බවට පත්වේ. එය එහි පැවැත්මට හානියකි (ප්‍රියලාල්, 1993, 31). මෙවැනි තත්ත්වයක් තුළ සමථ මණ්ඩලය ක්‍රියාත්මක වීමේ දී සමථකරුවන් මෙන්ම පාර්ශවකරුවන් ද, දැඩි අපහසුතාවයට පත් වේ. එමෙන්ම වර්තමානය තුළ බොහෝ සමථ මණ්ඩල පවත්වාගෙන යනුයේ ස්ථිර ස්ථානයක නොවේ. එතුළින් ආරක්ෂිතව පවත්වා ගත යුතු ලිපි ලේඛන තබා ගැනීමට ස්ථානයක් නොමැතිවීම, නිදහස් පරිසරයක පවත්වාගෙන යාමට නොහැකිවීම තුළ බොහෝ දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුවේ.

වර්තමාන සමාජ රටාව තුළ ආරවුල්වලට තරුණපෙළ ගොදුරුවනු දක්නට ලැබෙන අතර එම ආරවුල් නිරවුල් කිරීම සඳහා තරුණ හැඟීම් සහ තරුණ අදහස් පිළිබඳ මනා අවබෝධයක් ඇති තරුණ සමථකාරවරුන් යෙදවිය හැකි වන්නේ නම් වඩාත් ඵලදායී වනු ඇත (ඒකනායක, 2001, 49-50). සමථ මණ්ඩල තුළ බොහෝ විට දක්නට ලැබෙනුයේ විශ්‍රාමික සමථකාරවරුන්ය. තරුණ පිරිස් අතර ගැටුමක් ඇති වූ විට ඔවුන්ගේ අදහස් හෝ හැඟීම් අවබෝධ කර ගනිමින් එම ගැටුමට අවශ්‍ය

විසඳුම් ඉදිරිපත් කිරීමට තරුණ සමථකාරවරුන් සේවය කරන්නේ නම් සාර්ථක විසඳුමක් ලබා ගැනීමට හැකිවේ. සමථ මූල මණ්ඩලයට පවතින තවත් ගැටලුවක් ලෙස දැක්විය හැක්කේ ගමන් අපහසුවයි. එනම් ඇතැම් ආරවුල් විසඳීමේ දී දෙතුන් දෙනෙකුට බොහෝ දුරට යාමට කුලී රථ අවශ්‍ය බැවින් රුපියල් සිය ගණනින් වැය කරන්නට සිදු වී ඇත (චන්ද්‍රසේන, 1998, 80). යම් ගැටුමක් ඉදිරිපත් වූ විට ඒ සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනයක් සිදු කිරීමට අවශ්‍ය වූ විට එම ස්ථාන වෙත ගමන් කිරීමට පහසුකම් නොමැතිවීම තුළ සමථකරුවන් මෙන්ම පාර්ශවකරුවන් යන දෙපිරිසම අපහසුතාවයට පත්වන අතර එම ගැටලුව සඳහා අවශ්‍ය සාර්ථක විසඳුමක් ලබාදීමට ද, නොහැකි වේ. සමථ මූල මණ්ඩලය ආරම්භයේ දී සභාපතිවරයාට ඇති ලියකියවිලි පිළිබඳව කටයුතු තළ හැකි වුවත් ජනතාව දැනුවත් වීමෙන් ආරවුල් සම්බන්ධ කටයුතු වැඩි වනවාත් සමඟම ලියකියවිලි යැවීම, ලේඛන නඩත්තු කිරීමේ කාර්යයන් බහුල වන බැවින් ඔහුට ලිපිකරු සහාය ලබා ගැනීමේ අවශ්‍යතාව මතුවේ. ඒ සඳහා ලිපිකරු දීමනාවක් ගෙවීමක් හෝ එක් සමථ මූල මණ්ඩලයක් වෙනුවෙන් ලිපිකරුවෙකු හෝ පත් කරන්නේ නම් වඩාත් ඵලදායී වනු ඇත (චන්ද්‍රසේන, 1998, 72). එමෙන්ම අනවශ්‍ය ආකාරයෙන් දේශපාලන මැදිහත්වීම් සිදුවීම ආදිය තුළින් ආරවුල්කරුවන් මෙන්ම සමථකරුවන් අපහසුතාවයට පත්විම දැකගත හැකිය.

## සමථ මූල මණ්ඩලය කෙරෙහි ජනතාවගේ දැනුවත්භාවය සහ ආකල්ප

සමථ මූල මණ්ඩලය පිළිබඳව දැනුවත්භාවය පිළිබඳව විමසීමේ දී බොහෝ ජනතාව තුළ පවතිනුයේ අඩු අවබෝධයකි. මන්ද සමථ මණ්ඩලය පිළිබඳව දැනුවත්වීමට බාහිර කිසිඳු ආයතනයක් හෝ වැඩසටහනක් නොමැතිවීමයි. පොලිසීය සහ උසාවිය ආදී ස්ථාන තුළින් සමථකරණයට පැමිණිලි ඉදිරිපත් කළ විට සමථ මූල මණ්ඩලය කරා ජනතාව යොමු වුවද එහි කාර්යභාරය පිළිබඳව අවබෝධයක් නොමැත. එම නිසාවෙන් එතුළින් ලැබෙන ප්‍රතිඵල විශ්වාස කිරීමට පාර්ශවකරුවන් බැඳී නොතිබෙන අවස්ථා ද ඇත.

සමථ මූල මණ්ඩලය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ දී ජන මාධ්‍යවලින් ලැබෙන සහය අල්ප වී ඇත. එදිනෙදා පුවත්පත් සති අන්ත පුවත්පත්, ගුවන්විදුලිය, රූපවාහිනිය මගින් සමථ මූල මණ්ඩලය පිළිබඳ පුළුල් දැනීමක් ලබා දෙන්නේ නම් එදිනෙදා ගම්වල ඇතිවන ආරවුල් සමථ මූල මණ්ඩලයට යොමුවන ඇත (ගජනායක, 1998, 64). මෙලෙසින් විද්‍යුත් මාධ්‍ය සහ මුද්‍රිත මාධ්‍ය හරහා ජනතාව දැනුවත් කරමින් කටයුතු කරන්නේ නම් විශාල මෙහෙයක් කළ හැකිය. එයට හේතු වනුයේ ජනතාව ඒ පිළිබඳව දැනුවත් වීමට පවතින සාර්ථකම ක්‍රමයක් ලෙස ජනමාධ්‍ය හැඳින්විය හැකිවන නිසාය. එමෙන්ම ආරවුල්කරුවන් ආකල්ප තුළ ද, විවිධ ගැටලු පවතී. එනම් සමථ මණ්ඩලයට ආරවුල් යොමු කරන පුද්ගලයින් අධිකරණයට යාමට තරම් වත්පොහොසත්කමින් අඩු අය හැටියට සමාජය තුළ ඇතැම් අවස්ථාවලදී වැරදි මතයක් ගොඩනැගී තිබෙනු දක්නට ලැබුණි. එසේ වීමට බොහෝ දුරට හේතු වී ඇත්තේ යථාර්ථය පිළිබඳ දැනුම මදිකමින් හා සමථ මණ්ඩල ඉදිරියට යාම මදිකමක් සේ සලකන සමහර අය තවමත් ගම්වල සිටීම හේතු කොටගෙනය (ඒකනායක, 2001, 43). සමථ මණ්ඩලය වෙත පෞද්ගලිකව ආරවුල් යොමු කිරීම පහළ මට්ටමක පවතිනුයේ ඔවුන්ට ඒ පිළිබඳව දැනුවත්භාවයක් ලබා ගැනීමට ක්‍රමයක් නොමැති වීම තුළයි. පොලිසීය, උසාවිය, අධිකරණය තුළින් බොහෝ ආරවුල් සමථ මණ්ඩලය වෙත යොමු කිරීම තුළ ඒ පිළිබඳව දැනුවත් වේ. නමුදු අධිකරණමය හෝ පොලිසියේ ලබාදෙන විසඳුමක් මෙන් සමථ මණ්ඩලය තුළින් ලබාදෙන විසඳුම පිළිගැනීමට ජනතාව මදිකමක් දක්වයි. එයට හේතු වනුයේ ප්‍රාදේශිය සමථකරුවන්ම එහි කටයුතු කිරීම නිසා ඔවුන් ලබාදෙන පිළිතුර කෙරෙහි විශ්වාසය නොතිබීම ජනතාව තුළ පවතින ආකල්පමය දෘෂ්ටිය වේ. එම නිසාවෙන් සමථ මණ්ඩල ක්‍රමය පිළිබඳව ජනතාවට දැනුවත්භාවයක් ලබාදීමට කටයුතු කළ යුතුය.

## සමථ මණ්ඩලය පොලීසිය හා ග්‍රාම නිලධාරීවරයා අතර සබඳතාව

### පොලීසිය සහ සමථ මණ්ඩලය අතර පවතින සබඳතාවයේ ස්වභාවය

නීතිය හා සාමය ආරක්ෂා කිරීමට බිහි වී ඇති විධිමත් සිවිල් ආයතනයක් ලෙසින් පොලීසිය හැඳින්විය හැකිය. රටට උසස් තත්ත්වයේ යහපත් සේවාවක් ලබාදීමට නිරතුරුවම බැඳී සිටියි.

අධිරාජ්‍යවාදීන්ගේ කාලයේ පටන් වර්තමානය දක්වා ක්‍රියාත්මක වන මෙය සමාජය තුළ පවතින වැදගත් ආයතනයකි. සමථ මණ්ඩලය හා පොලීසිය අතර විධිමත් සම්බන්ධයක් නැති වූව ද, යථාර්ථය වන්නේ පොලීසිය ආරවුල් සමථකරණයට යොමු කිරීමේ වැදගත් කාර්යභාරයක් ඉටු කිරිම පමණක් නොව සමහරවිට ඉන් ඔබ්බට ගොස් සමථ මණ්ඩලයට පාර්ශවයන් ගෙන්වා ගැනීමට ද උපකාරීවන ලබයි. විධිමත් ක්‍රියාපටිපාටි ඇති කර ගැනීම තුළින් ලබා ගත යුතු හා හුවමාරු කර ගත යුතු තොරතුරු වර්ග පැහැදිලි කරගත හැකි වන අතර කිසියම් ආරවුලක් සම්බන්ධයෙන් පොලීසියෙන් අපේක්ෂිත කාර්යභාරය කටයුතු කර ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත (අරන්දර, 2011, 43). පොලීසිය හා ගම අතර අන්‍යෝන්‍ය අවබෝධය සහ සුහදත්වය විශ්වාසය ඇති කරමින් යුක්ති සහගත සාධාරණ සමාජයක් නිර්මාණය කරනුයේ සමථ මණ්ඩලය තුළිනි. වරදවල් සම්බන්ධයෙන් පොලිස් ස්ථානවලට පැමිණිලි කිරීමෙන් පසු සිය කටයුතුවලට අමතරව පොලිස් ස්ථානාධිපති විසින් එම ආරවුල් ප්‍රදේශයේ සමථ මූල මණ්ඩලයේ සභාපතිවරයා වෙත යොමු කළ යුතුය. එසේ කිරීමේදී ආරවුලේ ස්වභාවය කෙටියෙන් සහ අදාළ පාර්ශවයන්ගේ නම් හා ලිපිනයන් ද, සඳහන් කොට මුද්දර ගාස්තු රහිතව යැවීම ප්‍රමාණවත් වේ. මේ සඳහා පොලීසියේ පැමිණිලි පිටපත් හා වෙනත් ලියවිලි ඉදිරිපත් කිරිම අත්‍යවශය. එහෙත් මහජනතාව විසින් මේ සඳහා කිසිවෙකුටත් මුදල් ගෙවීමක් කළ යුතු නොවේ (වීරසූරිය, 1998,22). ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයකට එකක් බැගින් පොලිස් ස්ථාන ලංකාව පුරා බොහොමයක් ක්‍රියාත්මක වේ. මෙලෙසින් ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක වන පොලිස් ස්ථාන ප්‍රාදේශීය සමථ මණ්ඩල සමඟ සබඳතාවයක් පවත්වන අතර එනම් පොලිස් ස්ථාන වෙතට යොමුවන පැමිණිලි අතුරින් යම් ආකාරයකට සමථකරණයකට ලක් කළ හැකි පැමිණිලි සමථ මණ්ඩල වෙත යොමු කරයි. මෙලෙසින් සමථ මණ්ඩල වෙත ආරවුල් යොමු වුව ද ආරවුල්කරුවන්ගේ කැමැත්ත අකමැත්ත මත විසඳුම ලබාදීමට කටයුතු කළ යුතුය. මෙහිදී එම ආරවුල පිළිබඳව සමථයකට පත්වීමට ආරවුල්කරුවන්ට නොහැකි වුයේ නම් සමථ මණ්ඩලය විසින් ආරවුල් නොකිරීමේ සහතිකයක් නිකුත් කරමින් නැවතත් පොලිසීය වෙත එම ආරවුල ඉදිරිපත් කරනු ලබයි. මේ අයුරින් ආරවුල් සම්බන්ධව පොලිසීය හා සමථ මණ්ඩලය අතර සබඳතාවයක් පවතී.

## ග්‍රාමනිලධාරි සහ සමථ මණ්ඩලය අතර පවතින සබඳතාවයේ ස්වභාවය

ගම තුළ වෙසෙන ගමේ ප්‍රධාන පරිපාලකයා ලෙස ගම තුළ වෙසෙන ජනතාව සමඟ නිරන්තර සහසම්බන්ධතාවයක් මෙන්ම සම්බන්ධීකරණයක් සිදු කරනු ලබන්නේ ග්‍රාමනිලධාරී විසිනි. එමෙන්ම දුෂ්කරතා මධ්‍යයේ වුව ද, තම රාජකාරිය නොපිරිහෙලා ඉටු කරමින් පුළුල් වූ රාජකාරියක් ග්‍රාමනිලධාරී සිදු කරයි. උපතේ සිට මරණය දක්වා සියලු වගකීම් ජනතාව වෙනුවෙන් ඉටු කරන මොහු රාජකාරිය යුක්ති සහගත ලෙසින් ඉටු කරනු ලබයි. මේ අනුව ග්‍රාමනිලධාරී ජනතා සේවයට ලොකු ශක්තියක් වේ. ආරච්චිල තනතුර ගම්මුලැදෑනිවරයා දක්වා ද, පසුව ග්‍රාමසේවක ලෙස ද, වර්තමානයේ එය ග්‍රාමනිලධාරි දක්වා ද, විකාශය වී ඇත. අදටත් අගනුවරින් බැහැර බොහෝ ප්‍රදේශවල ග්‍රාමනිලධාරි මහතා හඳුන්වනුයේ රාළහාමි වශයෙනි (සමරවික්‍රම, 2011). මෙවැනි වගකීමක් දරනු ලබන ග්‍රාමනිලධාරී සමථ මණ්ඩලය සමඟ සමීප සබඳතාවයක් පවත්වාගෙන යනු ලබයි. යම් මණ්ඩලයක් විසින් 10වන වගන්තියේ (අ) ඡේදය යටතේ 14 වන වගන්තියේ (2) වන වගන්තිය යටතේ තම කාර්ය කරගෙන යාමේ දී, ආරවුල්කරුවෙකුට හෝ වෙනත් තැනැත්තෙකුට යම් දැනුම් දීමක් කිරීම පිණිස තම සහය දෙන ලෙස සමථ මණ්ඩල ප්‍රදේශය තුළ ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාසය සඳහා පත් කරන ලද යම් ග්‍රාමසේවා නිලධරයකුට නියම කරනු ලැබිය හැකි අතර, එසේ නියම කරනු ලැබූ කල්හි ඒ ග්‍රාමසේවා නිලධරයා විසින් ඒ මණ්ඩලයට ඒ පිළිබඳව අවශ්‍ය සියලු සහාය දිය යුතුය ( 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත). මෙසේ ග්‍රාමනිලධාරී විසින් පාර්ශවකරුවන්ට දැන්වුව ද, ඔවුන් සමථ මණ්ඩලය කෙරෙහි නැවත නොපැමිණි විට නිරවුල් නොකිරීමේ සහතිකයක් නිකුත් කරනු ලබයි. මේ අනුව ග්‍රාමනිලධාරී සහ සමථ මණ්ඩලය අතර සමීප සබඳතාවයක් පවත්වාගෙන යනු ලබයි.

## නිගමනය

ශ්‍රී ලංකාවේ ප්‍රාදේශිය වශයෙන් ක්‍රියාත්මක වන අවිධිමත් ආයතනයක් ලෙසින් සමථ මණ්ඩලය හැඳින්විය හැකිය. අතීතයේ සිට සමථකරණ විධි ක්‍රමයන් පැවතුණ ද ප්‍රාදේශීය ජනතාව අතර බොහෝ කාලයක සිට ක්‍රියාත්මක වන සමථ මණ්ඩලය ප්‍රජාවට සහ දේශයට වටිනා සේවයක් ලබාදෙනු ලබයි. සමථකරුවෙකු ලෙස කටයුතු කිරීම දද විශාල වූ ගෞරවයක් සහ වරප්‍රසාදයක් ලෙස සලකනු ලබයි. නමුදු මෙම ආයතනය පිළිබඳ ජනතාවගේ පවතින නොදැනුවත්භාවය සහ ආකල්ප නිසා ද, මෙම ආයතනය දිරි ගැන්වීමට කිසිඳු ආයතනයක් නොමැතිවීම සහ ආයතනයට අවශ්‍ය භෞතික පහසුකම් නොමැතිවීම තුළ එහි සමථකරුවන් මෙන්ම ගැටුම් විසඳා ගැනීමට පැමිණෙන ආරවුල්කරුවන් ද, බොහෝ ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දෙනු ලබයි. මෙම ගැටලුකාරී තත්ත්වයන්ට අවශ්‍ය සහයෝගය රජය හෝ යම්කිසි ආයතනයක් විසින් ලබාදෙනු ලබන්නේ නම් මෙම සමථකරණ ක්‍රියාවලිය හරහා සිදුවන සේවාව ඉහළ මට්ටමකට පත් කර ගත හැකිය. එමෙන්ම එතුළින් සමාජයේ පවතින ගැටුම් යම් ප්‍රමාණයකින් අවම වේ. කෙසේ වුව ද, වර්තමානය තුළ ප්‍රදේශිය ජනතාවට වැදගත් ආයතනයක් ලෙස සමථ මණ්ඩලය හැඳින්විය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ


ඒකනායක, සී., 2001. *ශ්‍රී ලංකාවේ සමථ මණ්ඩල. කොළඹ:* රත්න පොත් ප්‍රකාශකයෝ.

කාර්යසාධන වාර්තාව., 2013. කොළඹ: අධිකරණ අමාත්‍යංශය.

කුමාරස්වාමි, ඒ, කේ., 1962. *මධ්‍යකාලීන සිංහල කලා.* කොළඹ: සංස්කෘතික දෙපාර්තමේන්තුව.

කොස්තා, ජේ., 1985. *ශ්‍රී ලංකාවේ නීතිය.* කොළඹ: යූ.ඩී. ආරියදාස.

ගුණවර්ධන, එම්., 2011. *යුක්තිසහගත විකල්පයක්.* වැල්ලම්පිටිය: ගුණරත්න ඔෆ්සෙට්.

චන්ද්‍රසේන, ඇස්.ඇම්., 1998. *ශ්‍රී ලංකාවේ සමථ මණ්ඩල පිළිබඳ විද්වතුන්ගේ මත.* කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ.

මාපා, ජේ.පී., 2001. *සමථකරණය හා සමාජ නීති සංග්‍රහය.* කර්තෘ ප්‍රකාශනයකි.

මුවර්, කේ. ඩබ්, ජයසුන්දර, ආර් සහ තිරනාසුකරසු, එම්., 2011. *සමථකරණ ක්‍රියාවලිය. අධිකරණ අමාත්‍යංශය.*

වන්නිආරච්චි, ජේ.පී., 2002. *සමථ මණ්ඩල කළමනාකරණය.* කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ.

සිල්වා, ටී., 2004. *සමථ මණ්ඩල.* කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

*1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත.* කොළඹ: ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.